CENTRE FOR MONITORING ELECTION VIOLENCE
මැතිවරණ ප්‍රචණ්ඩක්‍රියා නිරීක්ෂණ මධ්‍යස්ථානය
தேர்தல் வன்முறைகளைக் கண்காணிப்பதற்கான நிலையம்
No 160G, Poorwarama Road, Kirulapone. **Tel:** +094-11 2826388/+094-11 2826384
**Tel:** +094-11 2826381 /+094-11 2826387 /+094-11 2826380
**Fax**: +094-11 2826146 **E-mail**: cmev@cpalanka.org **Web**: www.cmev.org

මහින්ද දේශප්‍රිය මහතා, සභාපති, ජනාධිපති නීතීඥ නලීන් අබේසේකර මහතා, සාමාජික, මහාචාර්ය රතනජීවන් හූල් මහතා,සාමාජික ,
මැතිවරණ කොමිෂන් සභාව,
මැතිවරණ මහලේකම් කාර්යාලය,
රාජගිරිය
2020 අප්‍රේල් 17

හිතවත් සභාපතිතුමන් ප්‍රමුඛ, සාමාජික මහත්වරුණි,

නිල ජන්දහිමි නාම ලේඛන මැතිවරණ කොමිෂන් සභාවේ අනුමැතියකින් තොරව භාවිත කිරීම හා මැතිවරණ ප්‍රචාරක සමයක් තුළ රාජ්‍ය සම්පත් අයථා පරිහරණය

අනපේක්ෂිතව උද්ගතවූ කොවිඩ් -19 ව්‍යසනයට ප්‍රතිචාර දැක්වීම සඳහා රජය මගින් දැනටමත් සමාජ ප්‍රතිලාභ වැඩසටහන් කිහිපයක් දිවයින පුරා ක්‍රියාත්මකව පවතින බව ඔබ කොමිෂන් සභාවද හොඳින්ම දන්නා කරුණකි. එහෙත් එකී සහන සැලසීමේ ක්‍රියාවලියට සමගාමීව අදාළ ප්‍රතිලාභීන් තෝරාගැනීම හා ක්‍රියාත්මක යාන්ත්‍රණය පිළිබඳව දිනෙන් දින අප වෙත විවිධ පාර්ශව වෙතින් ලැබෙමින් පවතින වාර්තා හා කරුණු දැක්වීම් ප්‍රමාණය ද අධිකය. ඒ මැතිවරණ කාල සීමාවක් තුළ දියත් කොට ඇති එකී සමාජ ප්‍රතිලාභ වැඩසටහන් යම් දේශපාලනීකරණය වීමක් යටතේ සිදුවෙමින් පවතින්නේය යන චෝදනාව පදනම් කරගනිමිනි.

එවැනි මතභේදාත්මක පසුබිමක දියත්ව ඇති එකී වැඩසටහන් මාලාවෙහි තවත් එක් අංගයක්ව ඇත්තේ පොරොත්තු ලේඛනගත කොට ඇති සමෘද්ධි ප්‍රතිලාභීන් සඳහා රු.5,000 ක දීමනාව ලබාදීමයි.


ඊට අදාළ ප්‍රතිලාභීන් හඳුනා ගැනීම, ද්විගුණනය වැලැක්වීම ආදී කරුණු දක්වා සමෘද්ධි අධ්‍යක්ෂ ජෙනරාල්වරයා DSD/HO/5 ME/GH/01 සහ 2020-04-01 මෙන්ම DSD/HO/DG චක්‍රලේඛ හා 2020-04 -12 දිනැතිව දිසාපතිවරුන් අමතා යවා ඇති ලිපි මගින් ඉල්ලා ඇත්තේ වසර 2019 අනුමත ජන්දහිමි නාම ලේඛන ප්‍රජාමූල බැංකු වෙත ලබා දීමට ක්‍රියා කරන ලෙසයි. එකී ඊට අදාළව ඔබ කොමිෂන් සභාව කවර ආකාරයේ තීරණයක් රැගෙන ඇද්දැයි යන්න පිළිබඳව අප සතුව අවබෝධයක් නැත. එකී කරුණට අදාළව ඔබ කොමිෂන් සභාව සුදුසු ප්‍රතිචාර දක්වනු ඇතැයි යන්න අපගේ විශ්වාසයයි.

ඒ අතරතුර අප වෙත ලැබී ඇති තොරතුරු මගින් තහවුරු වූයේ දැනටමත් දිවයිනේ බොහෝ ප්‍රදේශවල පිහිටි සමෘද්ධි ප්‍රජාමූල බැංකු හා සමෘද්ධි නිලධාරීන් එකී ජන්දහිමි නාම ලේඛන පරිශීලනය කරමින් සිටින බවයි. ග්‍රාම නිලධාරීන් බහුතරයක් අදාළ සහන සැලසීමේ ක්‍රියාවලියෙන් තාවකාලිකව ඈත්ව සිටින පසුබිමක මෙම ජන්දහිමි නාම ලේඛන මෙලෙස විවිධ පාර්ශව මගින් පරිශීලනය කරනු ලැබීම පිළිබඳව අප විමතියට පත්වූ බව ද දන්වා සිටිය යුතුමය.

එහිදී අප සංවිධානය මෙකී කරුණ පිළිබඳව වඩාත් විධිමත් නිරීක්ෂණයක් සිදුකරන ලද අතර එහිදී තහවුරු වූයේ සමෘද්ධි අධ්‍යක්ෂ ජෙනරාල්වරයාගේ මූලිකත්වයෙන්, කොළඹ පිහිටි එහි ප්‍රධාන කාර්යාලයේ පැවති හමුවකදී මෙම කරුණ සාකච්ඡා කොට ඇති බවත්, සාකච්ඡාව අවසන්ව පිටත්ව යන සමෘද්ධි දෙපාර්තමේන්තුවේ නිලධාරින් හට අදාළ ජන්දහිමි නාම ලේඛනයන්හි මුද්‍රිත පිටපත් විශාල ප්‍රමාණයෙන් ලබා දී ඇති බවත්ය.

මෙලෙස ලබාදුන් පිටපත් අදාළ නිලධාරින් මගින් සෙසු ක්ෂේත්‍ර රාජකාරියෙහි නිරත සමෘද්ධි නිලධාරීන් හා ප්‍රජාමූල බැංකු කළමණාකරුවන් වෙත නිකුත් කොට ඇත. අප වෙත ලැබී ඇති පැමිණිලිවල එකී

පිටපත් ද අමුණා ඇති අතර ඔබ කොමිෂන් සභාවේ දැනගැනීම පිණිස ඉන් එක් පිටපතක ස්කෑන් සටහනක්ද මෙම ලිපියට අඩංගු කොට ඇත.



එකී පැමිණිලි හා අදාළ පිටපත් සැසඳීමේදී තහවුරු වන්නේ ජන්දහිමි නාම ලේඛනය තොග වශයෙන් පිටපත් කොට ඇත්තේ සමෘද්ධි අධ්‍යක්ෂ ජෙනරාල්වරයාගේ අනුදැනුම හා උපදේශකත්වය යටතේ සමෘද්ධි දෙපාර්තමේන්තුව මගින්ය යන්නයි. එහි වඩාත් කණගාටුදායක කරුණ වන්නේ මෙලෙස බෙදා හරින ලද පිටපත් සෑමෙකක ම පාහේ ශ්‍රී ලංකා පොදුජන පක්ෂයෙහි කෙටි නම සඳහන් වීමයි. එනම් 'SLPP' ලෙසිනි. එලෙස පක්ෂ නම ද ඇතුළත් ජන්දහිමි නාම ලේඛන ලබාදීම සිදුකරනු ලබන්නේ එකී පක්ෂවල දේශපාලන ක්‍රියාකාරකම් පහසු කරගැනීම පිණිස ඔබ කොමිෂන් සභාවෙනි.එලෙස ඔබ කොමිෂන් සභාවෙන් දේශපාලන පක්ෂයක් වෙත ලබාදෙන කවර හෝ ලේඛනයක් රජයේ දෙපාර්තමේන්තුවක් හෝ වෙනත් සමගාමී ආයතනයකට ලබාදීම මෙන්ම අනිසි අයුරින් පිටපත් කිරීම නීත්‍යානුකූල නොවන්නා සේම කිසිසේත් අනුමත කල හැකි ක්‍රියාවක් නොවේ.

ඒ අනුව මැතිවරණ නිරීක්ෂණ සංවිධානයක් ලෙස පහත සඳහන් කරුණු කිහිපය ඔබ කොමිෂන් සභාවේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමු.

01. මැතිවරණ කොමිෂන් සභාව මෙරටේ දේශපාලන පක්ෂ වෙත ලබාදී ඇති යම් යම් ලේඛන මැතිවරණ කොමිෂන් සභාව නිල වශයෙන් වළක්වා ඇති කාර්යයක් සඳහා උපයෝගී කරගෙන ඇති අතර එවන් ක්‍රියාවක් සඳහා ඔබ යම් අනුමැතියක් ලබා දී තිබේද? නොඑසේනම් අදාළ දේශපාලන පක්ෂයට එරෙහිව යම් ක්‍රියාමාර්ගයක් ගැනීමට කටයුතු කරන්නේද?

02. මැතිවරණ කොමිෂන් සභාව නිල වශයෙන් වළක්වා ඇති කාර්යයක් රජයේ ප්‍රමුඛ පෙළේ නිලධරයෙක් වන සමෘද්ධි අධ්‍යක්ෂ ජෙනරාල් ආර්.පී.බී. තිලකසිරි මහතා විසින් නැවත ක්‍රියාත්මක කොට ඇත. එපමණක් නොව දේශපාලන පක්ෂයක් වෙත මැතිවරණ කොමිෂන් සභාව ලබා දී ඇති ලේඛනයක් රජයේ සම්පත් උපයෝගී කරගනිමින් පිටපත් කොට නීති විරෝධී අයුරින් දිවයින පුරා බෙදාහැර ඇත. තවද එකී ක්‍රියාවලිය සිදුකර ඇත්තේද. තම අනුමැතිය හා අස්සන යොදා සකස් කල නිල ලිපියක් ලේඛන හෝ මගින් නොව වාචිකවය. මෙය බරපතල ගණයේ විෂමාචාර ක්‍රියාවක් මෙන්ම මැතිවරණ නීතිද උල්ලංඝනය කරන්නක් බව ඉතා පැහැදිලිය. එහිලා මෙම සමස්ත ක්‍රියාදාමය මෙහෙයවා ඇති අදාළ නිළධරයා සම්බන්ධයෙන් ගැනීමට නියමිත ක්‍රියාමාර්ග කවරේද?

එවැනි විමසුම් අභියස ඔබ කොමිෂන් සභාව සතු දේපලක් යම් අවභාවිතාවකට ලක් වී ඇත්නම් එය නිවැරදි කිරීමට හා සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට අවස්ථාව උදාවන අතරම එවැනි විමසුම් හා තීරණ අනාගත පූර්වාදර්ශ බවට ද පත්වන්නේය යන්න අපගේ අදහසයි.

ඉහත කරුණ හා සබැඳිව ඔබ කොමිෂන් සභාව නිසි සැලකිල්ලක් දක්වනු ඇතැයි අපි අපේක්ෂා කරන්නෙමු!

ස්තූතියි,

මංජුල ගජනායක,
ජාතික සම්බන්ධීකාරක,

---

පිටපත්:

සමන් ශ්‍රී රත්නායක මහතා, කොමිෂනර් ජෙනරාල්, මැතිවරණ කොමිෂන් සභාව, මැතිවරණ මහලේකම් කාර්යාලය, රාජගිරිය
සුරංග රණසිංහ මහතා, සහකාර මැතිවරණ කොමසාරිස්, මැතිවරණ ආරවුල් නිරවුල් කිරීමේ ඒකකය, මැතිවරණ කොමිෂන් සභාව, මැතිවරණ මහලේකම් කාර්යාලය, රාජගිරිය